**ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවේ ඇතුළත් ආදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුමක්ද, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම්, සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණාත්මක බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු | 2.1.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ ක්‍රියාකාරකම් | 2.5 |
| | | 2. අනුකූල නොවීම් | 2.10 |
| | | 3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.11 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 (අ) |
| | | 2. ප්‍රතිපාදන වෙන් කර ඇතත් ආරම්භ නොකළ ව්‍යාපෘති | 2.1.2(ආ) |
| | | 3. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.1.2(ඇ) |
| | | 4. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය | 2.2.1 |
| | | 5. දේශිය අරමුදල් ව්‍යාපෘතිවල කාර්යසාධනය | 2.2.2 |

| | | | |
|---|---|---|---|
| | | 6. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම | 2.3.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකායරක් සලසා තිබීම. | 1. රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම | 2.4.(අ) |
| | | 2. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.4.(ආ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරීයා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 1. වාර්ෂික කාර්යසාධන වාර්තා ප්‍රමාද වී ඉදිරිපත් කිරිම | 2.1.3 |
| | | 2. පොදු තැන්පත් ගිණුම් | 2.9 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම | 2.6 (අ) |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.6 (ආ) |
| | | 3. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම | 2.6 (ඇ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.7 |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.8 |

## 2. ප්‍රමාණාත්මක සහ වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලැසුම් කිරිම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් 09ක් ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද
සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව (Time Schedule) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර කාර්යයන්වල කාර්යසාධක දර්ශක සඳහන් කර නොතිබුණි. එම නිසා ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට විවිධ ව්‍යාපෘති/ වැඩසටහන් 32 ක් සඳහා රු. මිලියන 2,852.8 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණත්, එම කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටු කර තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

(i) සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.මිලියන 75 ක ප්‍රතිපාදන සලසා එයින් රු. මිලියන 48.9 ක් උසස් අස්වැන්නක් සහිත පොල් පැළ නිෂ්පාදනය ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. එසේ වුවද, උසස් ශාක තෝරා ගැනීමේ දී තෝරාගත් ඉඩම් හිමියන් එම තෝරා ගත් පොල් ගස් වලින් බීජ පොල් ලබා දීමට අකැමති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අපේක්ෂා කළ පොල් පැළ නිෂ්පාදනය ඉටු වී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ යටතේ තේ නැවත වගාව සඳහා හෙක්ටයාරයකට රු.150,000 බැගින් පෙර ගෙවීම් කරන ලද ඉඩම් හෙක්ටයාර් 2,587 කින් තේ වගා සම්බන්ධ මූලික වැඩ ආරම්භ කර තිබුණේ ඉඩම් හෙක්ටයාර් 20.12 ක පමණි.

(iii) උඩරට පළාතේ කුඩා තේ වතු ආශ්‍රිත ග්‍රාමීය කෘෂි ප්‍රවේශ මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රවේශ මාර්ග 140 සකස් කිරීමට ගිවිසුම්ගතව තිබුණද, ප්‍රවේශ මාර්ග 88 ක් පමණක් පුනරුත්ථාපනය කර තිබුණි.

**(ආ) ප්‍රතිපාදන වෙන් කර ඇතත් ආරම්භ නොකළ ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේ දී පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් රු. මිලියන 259.2 ක් සලසා ගනිමින් ආරම්භ කිරීමට යෝජිතව තිබූ කුඩා තේ හා රබර් වතු හිමියන්ට සහන සැලැසීමේ ව්‍යාපෘති 02 ක් ප්‍රාදේශීය වතු සමාගම්වල සේවකයන්ට මූල්‍ය සහය දෙන ව්‍යාපෘතියක්, ස්වයංක්‍රීය වෙළඳ භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා රබර් පර්යේෂණ ආයතනයේ ගොඩනැඟිලි සහිත වතු 02 ක ඉඩම් අයිතිය නිරවුල් කිරීමේ කටයුතු වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

(ඇ) **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**---------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා කුඩා ජල ව්‍යාපෘති යටතේ නළ ළිං 80 ක් සමාලෝචිත වර්ෂයේදී ඉදිකර එම කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, ඒ සඳහා අවශ්‍ය රු.මිලියන 59.03 ක ප්‍රතිපාදන ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලයට ලබා දී තිබුණේ 2017 දෙසැම්බර් 06 දිනදීය. එසේම 2018 වන විටත් ව්‍යාපෘතියේ මූලික කටයුතු පමණක් ආරම්භ කර තිබුණි.

(ii) යෝජිතව තිබූ ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනයේ ජාතික අංශු මාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානය පිහිටුවීමේ කටයුතු සැලසුම් කලද ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී නිමකිරීමට අවශ්‍ය මෘදුකාංග හා උපකරණ මිලදී ගැනීමට සඳහා රු. මිලියන 49.7 ක ප්‍රතිපාදන රබර් පර්යේෂණ මණ්ඩලයට නිදහස් කර තිබුණේ 2017 දෙසැම්බර් 14 දින දීය.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

**-------------------------------**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2018 ජුනි 29 දිනදීය.

### 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති

**-------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දේශිය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 30 ක් සඳහා එකතුව රු. මිලියන 3,954.65 ක ප්‍රතිපාදනද, විදේශිය ආධාර ව්‍යාපෘති 02 ක් සඳහා රු.මිලියන 450 ක ප්‍රතිපාදනද සලසා තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.මිලියන 2,526.65 ක් හා රු.මිලියන 326.14 ක් වශයෙන් රු.මිලියන 2,852.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබූ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,551.85 ක් හෙවත් සියයට 35.23 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

### 2.2.1 විදේශ ආධාර ව්‍යාපෘති

**---------------------------**

වර්ෂ 2016 සිට 2021 දක්වා කුඩා තේ හා රබර් වතු හිමියන් නඟා සිටුවීම සඳහා කෘෂිකර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල (IFAD) හා ශ්‍රී ලංකා රජය දායකත්වය ලබා දී තිබුණි. මේ සඳහා දිස්ත්‍රික්ක 06 ක තේ නැවත වගාව හා දිස්ත්‍රික්ක 02 ක රබර් නව වගාව ප්‍රවර්ධනය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කුඩා තේ හා රබර් වතු හිමියන් පුනර්ජීවන ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුඩා තේ වතු හිමියන් සඳහා වෙළඳපොල විවිධාංගීකරණය කිරීම සහ වෙළඳපොල ඉලක්ක කරගත් නිෂ්පාදන සහායක කටයුතු සිදුකිරීම සඳහා රු.මිලියන 671 ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ වෙන්කර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) කුඩා තේ වතු හා රබර් වතු හිමියන්ට ණය පහසුකම් ලබාදීම සඳහා රු.මිලියන 139.89 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට අදාළ සංරචකය යටතේ ණය පහසුකම් ලබාදීමට කටයුතු කර නොතිබුණ.

**2.2.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති**

---------------------------------

දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සකස් කළ රබර් ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට 2016 ජුලි 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ අනුමත නිලධාරින් 5 දෙනෙකු බඳවා ගෙන නොතිබුණි. මේ හේතුවෙන් එම සැලැස්ම ක්‍රියාත්මක වීම වසරකට වැඩි කාලයකින් ප්‍රමාද වී තිබුණි.

(ආ) වර්ෂ 2008 සිට වර්ෂ 2017 දක්වා වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහන සඳහා ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 වෙනුවෙන් රු.මිලියන 475.36 ක් වැය කර තිබුණි. එසේම රෝගය වැළදීම හේතුවෙන් ගස් 293,306 ක් ඉවත්කර තිබූ අතර වන්දි ලෙස රු.මිලියන 327.73 ක් ගෙවා තිබුණි. එහෙත්, රෝග මර්දනය කිරීමට තවත් වර්ෂ කීපයක් ගතවන බවත් මෙම රෝගයට ඔරොත්තු දෙන සාර්ථක පොල් ප්‍රභේදයක් පොල් පර්යේෂණ ආයතනය විසින් මේ වන විට සොයාගෙන ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් අදහස් දක්වා තිබුණි.

**2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබාගැනීම**

------------------------------------------------------------

**2.3.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------

2017 අගෝස්තු මාසයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද පොල්, රබර්, තේ අන්තර්ජාතික ප්‍රදර්ශනයේ (CRT Trade Fair) සංවිධාන කටයුතු සඳහා රු.14,942,000 ක් වැයකර තිබුණද ඒ සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. එම ප්‍රදර්ශනයේ උත්සව කටයුතු සංවිධානය කිරීමට සංවිධායකවරයෙක් තෝරා ගැනීමට මිල කැඳවීම් කර ඉදිරිපත්ව තිබූ ලංසුවලින් වූ අවම ලංසුව පිළිගත හැකි හේතු නොදක්වා ප්‍රතික්ෂේප කර අවම මිලට වඩා වැඩි ලංසුවකට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් රු.9,839,300 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

--------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම**

--------------------------------------------------------------------

සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව 2015 වර්ෂයේ සිට මෙම අමාත්‍යාංශය යටතට පැවරී ඇති අතර 2010 වර්ෂයේ සිට එම සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් වඩා හොඳ සේවාවක් කුඩා රබර් වතු හිමියන්ට ලබාදීම අරමුණු කරගෙන සංස්ථාවේ කටයුතු නවතා සංස්ථාව සතු කර්මාන්තශාලා පෞද්ගලික අංශයට පවරා තිබුණි. එසේ වුවද, එම සංස්ථාව සතු ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව, නිල නිවාස තුනක් හා කර්මාන්ත ශාලාව පිහිටි අක්කර 24.3 ක ඉඩම සුදුසු ආයෝජකයෙකුට ලබා නොදීම නිසා 2010 වර්ෂයේ සිට උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් තුරුසවිය අරමුදල වෙත මෝටර් වාහන 02 ක් මුදාහැර තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රක්‍ෂණ, නඩත්තු හා අළුත්වැඩියා වියදම ලෙස රු. 695,133 ක් වැයකර තිබුණි.

## 2.5 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 අංක 31 දරන "කප්රුක් අරමුදල පනත" 21 ඡේදය අනුකූලව අමාත්‍යාංශය යටතේ වූ කප්රුක අරමුදල සඳහා එම අරමුදල පිහිට වූ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ වැඩසටහන් 02 කට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමකින් තොරව ගොඩනැගිලි කුලියට ගෙන තිබුණි. 2016 අගෝස්තු සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා භාවිතයට නොගත් ගොඩනැගිලි වෙනුවෙන් රු.2,490,000 ක කුලියක් ගෙවා තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව බත්තරමුල්ල ප්‍රදේශයෙන් රු.මිලියන 59.3 ක් වැයකර ගත්, පර්චස් 75 ක ඉඩමක් මිලදීගෙන ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අවශ්‍යතාව නොසලකා කාර්යාල පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු.මිලියන 119 ක් ගෙවා තිබුණි.

(ඈ) ඉඩම් කැබලි කිරීම පාලන පනතේ 12 (8) හා 24 වගන්තිය ප්‍රකාරව තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය අදාල කාර්යයන් ඉටු කිරීමේ රෙගුලාසි පිළිබඳව ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ) පලාත් පාලන ආයතනවල ඉඩම් කැබලි කිරීම සඳහා අවසරය ලබාදීමේදී තේ හා රබර් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1,005.90 | 954.22 | 51.68 | 5.14 |
| | මූලධන | 998.40 | 968.69 | 29.71 | 2.98 |
| | **එකතුව** | **2,004.30** | **1,922.91** | **81.39** | **4.06** |
| 2014 | පුනරාවර්තන | 1,176.06 | 1,132.19 | 43.87 | 3.73 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 2,001.95 | 1,710.82 | 291.13 | 14.54 |
| | **එකතුව** | **3,178.01** | **2,843.01** | **335.00** | **10.54** |
| 2015 | පුනරාවර්තන | 9,465.49 | 9,403.84 | 61.66 | 0.65 |
| | මූලධන | 3,123.35 | 2,417.33 | 706.02 | 22.60 |
| | **එකතුව** | **12,588.84** | **11,821.17** | **767.68** | **6.10** |
| 2016 | පුනරාවර්තන | 2,949.85 | 2,704.62 | 245.23 | 8.31 |
| | මූලධන | 6,606.85 | 4,761.05 | 1,845.80 | 27.94 |
| | **එකතුව** | **9,556.70** | **7,465.67** | **2,091.03** | **21.88** |
| 2017 | පුනරාවර්තන | 4,538.57 | 4,249.42 | 289.14 | 6.37 |
| | මූලධන | 5,077.04 | 2,856.23 | 2,220.8 | 43.74 |
| | **එකතුව** | **9,615.61** | **7,105.65** | **2,509.94** | **26.10** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 260.33 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර සියයට සියයක් ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 21 ක් සඳහා එකතුව රු.මිලියන 5,358.58 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 3,219 ක් පමණක් උපයෝජනය කිරීම නිසා, ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඇ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

සංවර්ධන උප ව්‍යාපෘති 06 කට පරිපූරක ඇස්තමේන්තු මගින් සලසාගෙන තිබූ එකතුව රු. 262,618,700 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

## 2.7 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේතය 20.02.01.04 ප්‍රාදේශීය වැවිලි සමාගම්වලින් අයකරන කල්බදුකුලී වෙනුවෙන් එකතුව රු.මිලියන 1,200 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 1,257.69 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 105 ක් වී තිබුණි.

ඉහත සඳහන් ආදායම් ගිණුම සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතු 571 ක් 1995 වර්ෂයේ දී ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 කට බදු දී තිබුණි. එයින් වැවිලි සමාගම් තුනක, 1994 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වටිනාකම රු. මිලියන 200 ක් ඉක්මවා නොතිබූ බැවින් බදු කුලී ගිවිසුම පරිදි එම සමාගම්වලින් 1995 වර්ෂයේ සිට බදු කුලී අයකළ නොහැකි වී තිබුණි. එසේ වුවද, 2011 වර්ෂය වන විට එම සමාගම්වල ශුද්ධ වත්කම් රු. මිලියන 200 ට වඩා වැඩි බව හඳුනාගෙන තිබුණ ද ගිවිසුම්වල බදුකුලී පිළිබඳව අවශ්‍ය සංශෝධන සිදුකිරීමට කටයුතු කර නොමැති වීම නිසා එම සමාගම් 3 යටතේ පවතින වතු 45 කින් රජයට කිසිදු බදු කුළියක් අය වී නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 175.48 ක බදුකුලී මුදලින් රු.මිලියන 129.76 ක් 2009 වර්ෂයේ සිට හිඟහිට තිබුණු අතර එම බදු මුදල් අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

## 2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 13501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 23.00 | 14.42 | 12.00 | 9.32 | 52.00 | 31.73 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව රු. 496,711 ක් වූ හිඟහිටි ශේෂ වර්ෂ 05ක කාලයක සිට පැවැත එමින් තිබූ අතර, ණය ශේෂ අයකරගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

## 2.9 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 47.02 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 200,000 ක තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පොල්, රබර් සහ තේ වෙළඳ ප්‍රදර්ශනය සඳහා 2017 වර්ෂයේදී ලැබූ මුදලින් ඉතිරි වූ රු. මිලියන 36 ක මුදල භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.10 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104 (4) | | අලාභ හානියට වගකිව යුත්තන් සහ නිශ්චය කිරීම සඳහා අලාභ හානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පරීක්ෂණයක් පවත්වා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (5) | 142,000 | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කළ වහාම එම අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 11 කදී ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම සඳහා මාස 01 ක සිට මාස 03 ක් අතර කාලයක් ගෙන තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | | දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### 2.11.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වෙන අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය සඳහා රු.මිලියන 280.10 ක් වැයකර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 25 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 591 | 449 | 142 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 66 | 55 | 11 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 26 | 53 | 14 | 41 |
| | එකතුව | 716 | 585 | 172 | 41 |